# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2095/14 - 2018 නොවැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2018.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ සීතාවකපුර නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතුකොටගෙන සීතාවකපුර නගර සභාවේ සභිකධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ සීතාවකපුර නගර සභාවේ අංක 01 කිරිවන්දල උතුර කොට්ඨාසයට තේරී පත් වූ වන්නකුවත්තෙවඩුගේ දොන් අජිත් ලක්ෂ්මන් පෙරේරා අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම සීතාවකපුර නගර සභාවේ අංක 01 කිරිවන්දල උතුර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා දිද්දෙනි ගමගේ ජානක රොෂාන් පුෂ්පකුමාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද ;

සීතාවකපුර නගර සභාවේ තේරීම්භාර නිලධාරී සුදු දේවගේ ශානික අනුරුද්ධ රූපසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් දිද්දෙනි ගමගේ ජානක රොෂාන් පුෂ්පකුමාර, සීතාවකපුර නගර සභාවේ අංක 01 කිරිවන්දල උතුර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. ඩී. එස්. ඒ. රූපසිංහ,
තේරීම්භාර නිලධාරී,
සීතාවකපුර නගර සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ.

11 - 687

1A - G 28841 — 17 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*